# වික්ටෝරියාවේ නව ළමා ආරක්ෂණ ප්‍රමිති

Sinhalese

New Child Safe Standards Information Sheet

## ළමා ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා නව ළමා ආරක්ෂණ ප්‍රමිති වික්ටෝරියාවේ 2022 ජූලි 1 වන දින ආරම්භ වේ

ළමා ආරක්ෂණ ප්‍රමිති (ප්‍රමිති) වික්ටෝරියා හි 2016 ජනවාරි මාසයේදී ආරම්භ විය. වසර පහකට පසු, මෙම ප්‍රමිති හේතුවෙන් ළමයින්ගේ හා තරුණ ප්‍රජාවේ ආරක්ෂාව වැඩිදියුණු වී ඇති ආකාරය අපි දැක ඇත්තෙමු.

අපගේ ප්‍රමිති වඩාත් ශක්තිමත් කිරීම සඳහා වෙනස්කම් සිදු කෙරෙමින් පවතී.

[1]ප්‍රමිති මගින් ආවරණය වන සංවිධාන **2022 ජූලි 1** වන විට නව ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. ඒ වනතුරු වර්තමාන ප්‍රමිති යෙදේ.

නව ප්‍රමිති අවම අවශ්‍යතා දක්වා ඇති අතර ළමයින් සහ තරුණයින් ආරක්ෂිතව තබා ගැනීම සඳහා සංවිධාන විසින් ගත යුතු ක්‍රියාමාර්ග පෙන්වයි. ඔවුන් සංවිධාන සඳහා වඩාත් පැහැදිලි බවක් ලබා දෙන අතර ඕස්ට්‍රේලියාවේ අනෙකුත් ප්‍රදේශවල ප්‍රමිති සමග වඩා අනුකූල වේ.

ළමයින් සහ තරුණයින් ආරක්ෂිතව තබා ගැනීම සඳහා සංවිධාන දැනටමත් කර ඇති දේ නව ප්‍රමිතිවලට අනුකූල වීමට ඔවුන්ට උපකාරී වෙයි. සමහර අවස්ථාවලදී, නව ප්‍රමිති සපුරාලීම සඳහා ආයතනවලට ඔවුන්ගේ වර්තමාන ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති, භාවිත සහ ආයතනික සංස්කෘතිය වෙනස් කිරීමට හෝ සංවර්ධනය කිරීමට අවශ්‍ය වෙයි.

**2022 ජූලි 1** වන විට නව ප්‍රමිති කරා යාමට ආයතනවලට උපකාර කිරීම සඳහා කොමිසම සහ අනෙකුත් නියාමකයින් විසින් වැඩිදුර තොරතුරු සහ මග පෙන්වීම් ඉදිරි මාසවලදී ලබා දෙනු ලැබේ.

## වෙනස්වන්නේ මොනවාද?

වික්ටෝරියා හි වර්තමාන ළමා ආරක්ෂණ ප්‍රමිතිවලට සමාන වුවත්, ප්‍රධාන වෙනස්කම්වල අඩංගු නව අවශ්‍යතා වන්නේ:

- ළමයින් සහ තරුණයින් ආරක්ෂාකාරීව තබා ගැනීමට සංවිධාන දරන උත්සාහ සඳහා පවුල් සහ ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම
- ආදිවාසී දරුවන් සහ තරුණයින්ගේ ආරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම
- අන්තර්ජාල මාර්ගගත පරිසරයන් තුළ ළමා අපයෝජන අවදානම කළමනාකරණය කිරීම
- ළමුන් සහ තරුණයින් ආරක්ෂිතව තබා ගැනීම සඳහා පාලනය, පද්ධති සහ ක්‍රියාවලින් සම්බන්ධ කාරණා.

## සංවිධාන දැන් කළ යුත්තේ කුමක්ද?

නව ප්‍රමිති සඳහා සූදානම් වීමට සංවිධාන:

- නව ප්‍රමිති සහ *වෙනස් වන්නේ කුමක්ද* යන්න දැනගැනීමට *නව දේ කුමක්ද ? නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය පිළිබඳ දළ විශ්ලේෂණය , , වෙනස් වන්නේ කුමක්ද? වර්තමාන සහ නව ළමා ආරක්ෂණ ප්‍රමිති සහ නිතර අසන ප්‍රශ්න සසඳා බලන්න* යනාදිය කියවීමෙන් වෙනස් වන දේ දැන ගන්න
- ඔබේ සංවිධානයට **2022 ජූලි 1** වනවිට නව ප්‍රමිතිවලට අනුකූල වීමට සිදු කළ යුත්තේ කුමක්ද සිතා වෙනස්වීමට දැන්ම සැලසුම් කරන්න

---

[1] ලබා ගැනීමේ පහසුව සඳහා අදාළ ආයතන' පිළිබඳ සියලු යොමු කිරීම් මෙම ලේඛනයේ 'සංවිධාන/ ය' සමඟ ප්‍රතිස්ථාපනය කර ඇත. අදාළ ආයතනයක් *2005, ළමා යහපැවැත්ම සහ ආරක්ෂාව පිළිබඳ පනතේ* 3(1) වගන්තියෙන් අර්ථ දක්වා ඇති අතර ළමා ආරක්ෂණ ප්‍රමිතිවලට යටත් වන ආයතන මේ සඳහා අදාළ කරගනී.


1300 782 978

contact@ccyp.vic.gov.au

ccyp.vic.gov.au

- කොමිසම විසින් නව තොරතුරු දෙනු ලැබූ විට හා ඔබේ සංවිධානයට නව ප්‍රමිතිවලට මාරු වීමට අවශ්‍ය උපදෙස් දෙනු ලැබූ විට ඒවා ඉ-තැපෑලෙන් ලබා ගැනට මෙහි ග්‍රාහක වන්න.

## නව ළමා ආරක්ෂණ ප්‍රමිති මොනවාද?

නව ළමා ආරක්ෂණ ප්‍රමිති 11 ක් පවතී:

**ළමා ආරක්ෂණ ප්‍රමිති 1 - ආදිවාසී දරුවන්ගේ හා තරුණයින්ගේ විවිධාකාර හා අද්විතීය අනන්‍යතා සහ අත්දැකීම්වලට ගරු කරන හා අගය කරන සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් සංවිධාන විසින් ස්ථාපිත කරනු ලැබේ**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 1 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

1.1 දරුවෙකුට ඔවුන්ගේ සංස්කෘතිය ප්‍රකාශ කිරීමට සහ ඔවුන්ගේ සංස්කෘතික අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති හැකියාව දිරිමත් කරනු ලැබේ.

1.2 ආදිවාසී සංස්කෘතියේ ශක්තීන් පිළිගැනීමට හා අගය කිරීමට සහ ආදිවාසී දරුවන්ගේ හා තරුණයින්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සඳහා එහි වැදගත්කම අවබෝධ කර ගැනීමට සියලු සාමාජිකයින්ට උපකරණ වන උපාය මාර්ග සංවිධානය තුළ අන්තර්ගත වේ.

1.3 සංවිධානය තුළ ජාතිවාදී අවස්ථා හඳුනා ගැනීම, මුහුණ දීම සහ නොඉවසීම සහතික කිරීම සඳහා සංවිධානය විසින් පියවර ගනු ලැබේ. ජාතිවාදයේ ඕනෑම අවස්ථාවක් කෙරෙහි සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

1.4 ආදිවාසී දරුවන්ට, තරුණයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සහභාගී වීමට හා සහයෝගයෙන් කටයුතු කිරීමට ක්‍රියාකාරීව සහය සහ පහසුකම් සපයයි.

1.5 සංවිධානයේ සියලුම ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, පද්ධති සහ ක්‍රියාවලි එක්ව සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත සහ සියල්ල ඇතුළත් පරිසරයක් නිර්මාණය කරන අතර ආදිවාසී දරුවන්ගේ, තරුණයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අවශ්‍යතාවලට ගැළපෙයි.

**ළමා ආරක්ෂණ ප්‍රමිති 2 - ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම සංවිධානයේ නායකත්වය, පාලනය සහ සංස්කෘතිය තුළ අන්තර්ගත වේ**ළමා ආරක්ෂණ ප්‍රමිතිය 2 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

2.1 ළමා ආරක්ෂාව සඳහා සංවිධානය පොදු කැපවීමක් කරයි.

2.2 ළමා ආරක්ෂණ සංස්කෘතියක් සංවිධානයේ සෑම තරාතිරමකම ඉහළ සිට පහළට සහ පහළ සිට ඉහළට ව්‍යාප්ත කර ඇත.

2.3 පාලන විධිවිධාන සෑම මට්ටමකම ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයයි.

2.4 චර්යාධර්ම පද්ධතිය මඟින් කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයින්ට අපේක්ෂිත චර්යාත්මක ප්‍රමිති සහ වගකීම් පිළිබඳ මාර්ගෝපදේශ සපයයි.

2.5 අවදානම් කළමනාකරණ උපාය මාර්ග මඟින් ළමයින්ට සහ තරුණයින්ට ඇති අවදානම වැළැක්වීම, හඳුනා ගැනීම සහ අවම කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

2.6 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් තොරතුරු හුවමාරු කර ගැනීම සහ වාර්තා තබා ගැනීම පිළිබඳ ඔවුන්ගේ යුතුකම් තේරුම් ගනී.

**ළමා ආරක්ෂණ ප්‍රමිතිය 3 - ළමයින්ට සහ තරුණයින්ට ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුම්දී ඇති අතර, ඔවුන්ට බලපාන තීරණවලට සහභාගී වීමට හැකියාව ඇති අතර ඔවුන්ට වැදගත් ලෙස සලකනු ලැබේ**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 3 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

3.1 ළමයින්ට, තරුණයින්ට ආරක්ෂාව, තොරතුරු සහ සහභාගීත්වය ඇතුළුව ඔවුන්ගේ සියලු අයිතිවාසිකම් පිළිබඳව දැනුම් දෙනු ලැබේ.

3.2 මිත්‍රත්වයේ වැදගත්කම හඳුනාගෙන ඇති අතර, ළමයින්ට සහ තරුණ පිරිස් වලට ආරක්ෂිත බවක් දැනීමට හා අඩු තනිකමක් දැනීමට සම වයසේ මිතුරන්ගෙන් ලැබෙන සහයෝගය දිරිගන්වනු ලැබේ.

3.3 සැකසුමට හෝ වැඩසටහනට අදාළ වන විට, ළමයින්ට සහ තරුණයින්ට ලිංගික අපයෝජන වැළැක්වීමේ වැඩසටහන් සහ අදාළ අදාළ තොරතුරු වයස් මට්ටමට සුදුසු ලෙස ලබා ගත හැකිය.

3.4 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් හානිකර සංඥා හඳුනා ගත හැකි අතර ළමයින්ට සහ තරුණයින්ට තම අදහස් ප්‍රකාශ කිරීමට, තීරණ ගැනීමේදී සහභාගී වීමට සහ ඔවුන්ගේ ගැටලු මතු කිරීමට ළමා හිතකාමී මාර්ගවලට පහසුකම් සපයයි.

3.5 සංවිධානවල ළමයින්ගේ හා තරුණයින්ගේ දායකත්වයට ප්‍රතිචාර දැක්වීමට පහසුකම් සපයන සංස්කෘතියක් වර්ධනය කිරීම සඳහා උපාය මාර්ග ඇත.

3.6 සංවිධාන ළමයින්ට සහ තරුණයින්ට සහභාගී වීමට අවස්ථාව ලබා දී ඔවුන්ගේ දායකත්වයට ප්‍රතිචාර දක්වන අතර එමඟින් විශ්වාසය හා ක්‍රියාකාරීත්වය ශක්තිමත් වේ.

**ළමා ආරක්ෂණ ප්‍රමිතිය 4 - පවුල් සහ ප්‍රජාවන් දැනුවත් වී ඇති අතර ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට සම්බන්ධ වේ**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 4 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

4.1 තම දරුවාට බලපාන තීරණවලට පවුල සහභාගී වේ.

4.2 සංවිධානය තම දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව ඇති ආකල්ප පිළිබඳව පවුල් හා ප්‍රජාව සමග විවෘතව සන්නිවේදනය කරන අතර ඔවුන්ගෙන් අදාළ තොරතුරු ලබා ගත හැකිය.

4.3 සංවිධානයේ ප්‍රතිපත්ති හා භාවිත සංවර්ධනය කිරීමේදී හා සමාලෝචනය කිරීමේදී පවුල් සහ ප්‍රජාවලට අදහස් දැක්වීමට යම් අයිතියක් ඇත.

4.4 සංවිධානයේ මෙහෙයුම් සහ පාලනය පිළිබඳව පවුල්, රැකබලා ගන්නන් සහ ප්‍රජාව දැනුවත් කරනු ලැබේ.

**ළමා ආරක්ෂණ ප්‍රමිතිය 5 - ප්‍රතිපත්ති හා භාවිතයේ දී සමානාත්මකතාව තහවුරු කර ඇති අතර විවිධ අවශ්‍යතාවලට ගරු කරනු ලැබේ**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 5 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

5.1 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් ඇතුළුව සංවිධානය ළමයින් සහ තරුණයින්ගේ විවිධ තත්ත්ව අවබෝධ කර ගන්නා අතර අවදානමට ලක්වූවන්ට සහාය සහ ප්‍රතිචාර දක්වයි.

5.2 ළමයින්ට සහ තරුණයින්ට සංස්කෘතික, ආරක්ෂිත, පහසුවෙන් ලබා ගත හැකි හැකි සහ තේරුම් ගැනීමට පහසු වන ආකාරයෙන් තොරතුරු, සහය සහ පැමිණිලි ක්‍රියාවලින් සඳහා ප්‍රවේශය ඇත.

5.3 ආබාධිත දරුවන් සහ තරුණයින්, සංස්කෘතික හා භාෂාමය වශයෙන් විවිධ පසුබිම්වල සිටින ළමුන් සහ තරුණයින්, නිවසේ ජීවත් වීමට නොහැකි අය සහ සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික හා අන්තර් ලිංගික දරුවන් සහ තරුණ තරුණියන්ගේ අවශ්‍යතා පිළිබඳව මෙම සංවිධානය විශේෂ අවධානයක් යොමු කරයි.

5.4 මෙම සංවිධානය ආදිවාසී දරුවන්ගේ හා තරුණයින්ගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන අතර ඔවුන්ට සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් සපයයි/ ප්‍රවර්ධනය කරයි.

**ළමා ආරක්ෂණ ප්‍රමිතිය 6 - ළමයින් සහ තරුණයින් සමග වැඩ කරන පුද්ගලයින් ප්‍රායෝගිකව ළමා ආරක්ෂාව සහ යහපැවැත්මේ වටිනාකම් පිළිබිඹු කිරීමට සුදුසු සහය දක්වයි**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 6 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

6.1 රැකියා දැන්වීම්, තීරක පරීක්ෂා සහ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා පූර්ව-රැකියා පරීක්ෂාව ඇතුළු බඳවා ගැනීම් ක්‍රියාමාර්ග මගින් ළමයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම අවධාරණය කරයි.

6.2 අදාළ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් දැනට වලංගු ළමා පරීක්ෂා හෝ ඊට සමාන පසුබිම් පරීක්ෂාවන් ඇතිව වැඩ කරයි.

6.3 සියලුම කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයන්ට වාර්තා තබා ගැනීම, තොරතුරු හුවමාරු කර ගැනීම සහ වාර්තා කිරීමේ යුතුකම් ඇතුළුව ළමයින් සහ තරුණයින් වෙනුවෙන් ඔවුන්ගේ වගකීම් පිළිබඳව සුදුසු දැනුවත් කිරීමක් හා පුහුණුවක් ලැබෙයි.

6.4 දැනට පවත්නා අධීක්ෂණ සහ පුද්ගලයින් කළමනාකරණ ක්‍රම ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරයි.

**ළමා ආරක්ෂණ ප්‍රමිතිය 7 - ළමයින් සම්බන්ධ ගැටලු හා චෝදනා සඳහා ක්‍රියාවලිය**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 7 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

7.1 සංවිධානයට පහසුවෙන් ලබා ගත හැකි, ළමයින් ප්‍රමුඛ කරගත් පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තියක් ඇ ති අතර, එහි නායකත්වයේ, කාර්ය මණ්ඩලයේ සහ ස්වේච්ඡා සේවකයින්ගේ කාර්යභාර සහ වගකීම්, විවිධ ආකාරයේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රවේශ, අදාළ ප්‍රතිපත්ති හෝ චර්යාධර්ම පද්ධති උල්ලංඝනය කිරීම් සහ එවිට ක්‍රියා කිරීමට හා වාර්තා කිරීමට ඇති යුතුකම් පැහැදිලිව දක්වයි .

7.2 පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලි ළමුන් සහ තරුණයින්, පවුල්, කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් විසින් වටහාගනු ලැබූ ඇති අතර සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත වේ.

7.3 පැමිණිලි බැරෑරුම් ලෙස සලකනු ලබන අතර ක්ෂණිකව හා තරයේ ප්‍රතිචාර දක්වයි.

7.4 නීතියට වාර්තා කිරීම අවශ්‍ය වුවත් නැතත්, අදාළ බලධාරීන්ට පැමිණිලි සහ උත්සුක වාර්තා කිරීම සහ නීතිය බලාත්මක කරන්නන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවිධානය සතුව ඇත.

7.5 වාර්තාකරණය, පෞද්ගලිකත්වය සහ රැකියා නීති බැඳීම් සපුරාලයි.

**ළමා ආරක්ෂණ ප්‍රමිති 8 - අඛණ්ඩ අධ්‍යාපනය සහ පුහුණුව තුළින් ළමුන් සහ තරුණයින් ආරක්ෂාකාරීව තබා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන්ට දැනුම, කුසලතා සහ දැනුවත්භාවය ඇත.**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 8 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

8.1 සංවිධානයේ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් පුහුණු කරනු ලැබේ.

8.2 අනෙකුත් ළමයින්ගෙන් හා තරුණයින්ගෙන් සිදුවන හානිය ඇතුළු ළමා හානිය පිළිබඳ සලකුණු හඳුනා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින්ට පුහුණුව හා තොරතුරු ලැබේ.

8.3 ළමුන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ගැටලුවලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින්ට පුහුණුව හා තොරතුරු ලැබේ.

8.4 ළමුන් හා තරුණයින් සඳහා සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් ගොඩනගන්නේ කෙසේද යන්න පිළිබඳ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින්ට පුහුණුව සහ තොරතුරු ලැබේ.

**ළමා ආරක්ෂණ ප්‍රමිතිය 9 - ළමයින්ට සහ තරුණයින්ට හානි කිරීමට ඇති අවස්ථාව අවම කරන අතරම භෞතික හා මාර්ගගත පරිසර ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරයි**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 9 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

9.1 දරුවෙකුගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය, තොරතුරු සඳහා ප්‍රවේශය, සමාජ සම්බන්ධතා සහ ඉගෙනීමේ අවස්ථාවන් බිඳීමකින් තොරව කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් සබැඳි හා භෞතික පරිසරවල අවදානම් හඳුනාගෙන ඒවා අවම කරයි.

9.2 අන්තර්ජාල මාර්ගගත පරිසරය භාවිත කරනු ලබන්නේ සංවිධානයේ චර්යාධර්ම සංග්‍රහය සහ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය හා භාවිතවලට අනුකූලව ය.

9.3 අවදානම් කළමනාකරණ සැලසුම් මගින් ආයතනික සැකසුම්, ක්‍රියාකාරකම් සහ භෞතික පරිසරය විසින් ඇති කරන අවදානම් සලකා බලයි.

9.4 තෙවන පාර්ශවවලින් කොන්ත්‍රාත් පහසුකම් සහ සේවා සපයන සංවිධානවල ළමුන්ගේ හා තරුණයින්ගේ ආරක්ෂාව සහතික කරන ප්‍රසම්පාදන ප්‍රතිපත්ති තිබේ.

**ළමා ආරක්ෂණ ප්‍රමිතිය 10 - ළමා ආරක්ෂණ ප්‍රමිති ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කර වැඩිදියුණු කරනු ලැබේ**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 10 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

10.1 සංවිධානය නිරන්තරයෙන් ළමයින්ගේ ආරක්ෂණ පිළිවෙත් සමාලෝචනය කිරීම, ඇගයීම සහ වැඩිදියුණු කිරීම සිදු කරයි.

10.2 අඛණ්ඩව වැඩිදියුණු කිරීමට උපකරණ වීම සඳහා හේතු සහ පද්ධතිමය දුර්වලතා හඳුනා ගැනීම සඳහා පැමිණිලි, උත්සුක සහ ආරක්ෂක කඩ කිරීමේ සිදුවීම් විශ්ලේෂණය කරනු ලැබේ.

10.3 සමාලෝචන මගින් සොයා ගනු ලබන දේ පිළිබඳව කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයින්ට, ප්‍රජාව සහ පවුල් සහ ළමුන් සහ තරුණයින් හට අදාළ දේසංවිධානය විසින් වාර්තා කරනු ලැබේ.

**ළමා ආරක්ෂණ ප්‍රමිතිය 11 - ළමයින්ට සහ තරුණයින්ට සංවිධානය ආරක්ෂිත වන්නේ කෙසේද යන්න ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ලිඛිතව දක්වයි**

ළමා ආරක්ෂණ ප්‍රමිතිය 11 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:

11.1 ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සියලුම ළමා ආරක්ෂිත ප්‍රමිතිවලට අනුකූල වේ.

11.2 ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ලේඛනගත කර ඇති අතර තේරුම් ගැනීමට පහසුය.

11.3 හොඳම පුහුණු ආකෘති සහ පාර්ශ්වකරුවන්ගේ උපදේශනය ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමට උපකරණ වෙයි.

11.4 නායකයින් මගින් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූල ව ප්‍රමුඛත්වය ගැනීම සහ උදාහරණ වීම සිදු වේ.

11.5 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි තේරුම් ගෙන ක්‍රියාත්මක කරයි.

**සංවිධාන 2022 ජූලි 1 නව ප්‍රමිති හඳුන්වා දෙනතුරු වර්තමාන ළමා සුරක්ෂණ ප්‍රමිති සමග ක්‍රියා කළ යුතුය**

## සහය ලබාගන්නේ කෙසේද?

නව ප්‍රමිති වෙත මාරුවීම සඳහා ආයතනවලට සහය ලබා ගැනීම සඳහා ළමා ආරක්ෂණ ප්‍රමිති නියාමකයින්, උපදෙස් සේවා හෝ කර්මාන්ත ආයතනවල මාර්ගයෙන් තොරතුරු සහය ලබා ගත හැකිය. කොමිෂන් සභාවේ *නිතර අසනු ලබන ප්‍රශ්න* (සබැඳිය) තුළ විවිධ ළමා ආරක්ෂණ ප්‍රමිති නියාමකයින් පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබා දී ඇත.

ඔබට ගැටලු හෝ ප්‍රශ්න සඳහා කොමිසම සම්බන්ධ කරගත හැක:

- දුරකථන: 1300 782 978 හෝ (03) 8601 5281
- ඉ-තැපැල: contact@ccyp.vic.gov.au
- කොමිසමේ වෙබ් අඩවියට යන්න: www.ccyp.vic.gov.au

ඔබට පරිවර්තකයෙකු අවශ්‍ය නම්, 13 14 50 අංකයට පරිවර්තන හා අර්ථකථන සේවාව අමතා 03 8601 5281 අංකයෙන් ළමයින් හා තරුණයින් සඳහා වූ කොමිෂන් සභාව සම්බන්ධ කිරීමට ඉල්ලා සිටින්න.